# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

# ඇබෑර්තු - අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය

## තොරතුරු තාක්ෂණ හා ප්‍රවර්ධන මධ්‍යස්ථානය

01. ජාල පරිපාලක තනතුර - II ශ්‍රේණිය
02. වෙබ් අඩවි නිර්මාණකරු තනතුර - II ශ්‍රේණිය

### වැටුප් පරිමාණ

01. ජාල පරිපාලක තනතුර - II ශ්‍රේණිය සහ වෙබ් අඩවි නිර්මාණකරු තනතුර - II ශ්‍රේණිය
    U-AS 2 (II) Rs. 50,625- 3 x 1,335 - 54,630 (EB) 55,965 - 14 x 1,335- 74,655 p.m

### බඳවා ගැනීමේ ක්‍රමවේදය

අභියෝග්‍යතා පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### වෙනත් ප්‍රතිලාභ

ජීවන වියදම් දීමනාව, සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනාව, නොමිලේ ලබා දෙන සෞඛ්‍ය රක්ෂණය, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර සහ වෙනත් වරප්‍රසාද

**පොදු කොන්දේසි**

01. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ අභියෝග්‍යතා පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
03. අයදුම්කරුවන් තෝරා ගැනීම, ඒ ඒ තනතුරෙහි / ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
04. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.
05. අයදුම්කරුවන් අභියෝගතා පරීක්ෂණවලට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
06. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකපත්හි සහතික කරන ලද ඡායා පිටපත් සහිතව **2022 අප්‍රේල් මස 22** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
07. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර ලිවිය යුතුය.
08. එක් අයදුම්කරුවෙක් එක් තනතුරකට වඩා අයදුම් කිරීමේදී එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
09. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.
10. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාල තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව එවනු ලබන හා ඉහත සඳහන් කොන්දේසි අංක 09 ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
11. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 725, 957 වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.
12. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.
13. ස්ථිර කාර්ය මණ්ඩල තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප ගෙවනු ලබන අතර වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

**<u>අයදුම්පත් එවිය යුතු ලිපිනය</u>**

**ලේඛකාධිකාරී,**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,**
**රත්මලාන 10390, ශ්‍රී ලංකාව.**
**විද්‍යුත් තැපෑල : staffrecruit@kdu.ac.lk**

**අවසාන දිනය**
**2022 අප්‍රේල් 22**

**වැඩි විස්තර සඳහා**
**පිවිසෙන්න**
**www.kdu.ac.lk**